මගේ අංකය / எனது இல. / My No. HRC/1106/21 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022-03-11

පෙත්සම්කරු : එච්. ඒ. එල්. රසික මයා,
නො 9/12 2/1,
කේම්බ්‍රිජ් පෙදෙස,
කුරුඳුවත්ත,
කොළඹ 07.

වගඋත්තරකරුවන් : 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

පැමිණිලි අංකය : එච්ආර්සි/1106/21

පැමිණිල්ල :-

පෙත්සම්කරු ඔහුගේ දරුවා වන හෙට්ටිආරච්චිගේ සයේන් සස්විදු යන අය වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයට ගෘහ මූලික පදනම යටතේ 2021 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා යොමු අංක RC/S/21/6144 යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ බව කියා සිටියි. ඒ අනුව 2020-12-28 දින අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බවත්, එහිදී පෙත්සම්කරුගේ අයදුම්පත්‍රය සහ අනිකුත් ලේඛණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔහුට පහත පරිදි ලකුණු ලබා දුන් බවට සඳහන් කර ඇත.

01. හිමිකම් ඔප්පුව සඳහා ලකුණු - 04

02. අතිරේක ලේඛණ සඳහා - 00




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

03. ජන්ද නාම ලේඛණය සඳහා - 00

04. ඔහුගේ නිවස සහ වගඋත්තරකාර පාසල අතර තිබෙන වෙනත් පාසල් සඳහා - 50ක්ද මුළු ලකුණු 54ක් ලබා දී තිබූ බව කියා සිටියි.

තවද මෙම ගණය යටතේ අදාළ වර්ෂයට වගඋත්තරකාර පාසලේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගන්නා අවම ලකුණ වූයේ 56.6ක් වේ. තවද පෙත්සම්කරු පවසා සිටින්නේ ඔහුට මෙම ලකුණු 54ට අමතරව හිමිවිය යුතු ලකුණු 7.5ක් හා අමතර ලේඛණ සඳහා හිමිවිය යුතු ලකුණු 1.8 මුළු ලකුණු වන 9.3 ලබා ගැනීමට අභියාචනා හා විරෝධතා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කරමින් 2021-04-24 වන දින පෙනී සිටියත්, සම්මුඛ පරීක්ෂණය විසින් ලබා දුන් ලකුණු වල කිසිදු වෙනසක් සිදු නොවූ බවය.

**පෙත්සම්කරු බලාපොරොත්තු වන සහනය :-**

RC/S/21/6144 දරණ යොමු අංකයට අදාලව දැනට ඔහුට ලබා දී ඇති ලකුණු 54ට අමතරව ලබා දිය යුතු ලකුණු 9.3 එකතු කරමින් ඔහුගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ අදාළ ශ්‍රේණියට ඇතුලත් කර දෙන ලෙස වගඋත්තරකරුවන්ට නිර්දේශයක් ලබා දෙන ලෙසයි.

මේ පිළිබඳව අදාළ පාර්ශවකරුවන් කැඳවා 2022-01-13 වන දින පරීක්ෂණයක් කල අතර, එහිදී පෙත්සම්කරු තවදුරටත් කියා සිටියේ ජන්ද හිමි නාම ලේඛණයේ ඔහු 2017, 2018 සහ 2019 වර්ෂ වලදී ඔහු විසින් ලබා දී ඇති ලිපිනය වන 9/12 කේම්බ්‍රිජ් පෙදෙස, කුරුඳුවත්ත, කොළඹ යන ලිපිනයේ ලියාපදිංචි වී සිටියත් ඔහුට ලැබිය යුතු ලකුණු 7.5 ලබා දී නොමැති බවද, තවද ඔහු විසින් ඉදිරිපත් කර ඇති ජාතික හැඳුනුම්පත, වාහන ලියාපදිංචි පත්‍රය සහ ජීවිත රක්ෂණ ආදියට ලකුණු 1.08ක් ලබා දිය යුතු බවත්, එකී වසරේ ගෘහ මූලික පදනම මත කොළඹ රාජකීය විද්‍යාලයට ළමුන් ඇතුලත් කර ගැනීමේ අවම ලකුණ වූයේ 56.06ක් වූ අතර, ඉහත කී ලකුණු 9.3 ඔහුට ලබා දී තිබුණේ නම් ඔහුගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2021 වසරට ඇතුලත් කිරීමට අවශ්‍ය ලකුණු ලබා ගැනීමට හැකියාව තිබූ බවත්ය.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පරීක්ෂණයට සහභාගී වූ වගඋත්තරකාර පාර්ශවයන්ට පවසා සිටියේ පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට පිළිතුරක් ලෙස පැවසීමට ඇත්තේ වරිපනම් අංක 02කින් එකම පරිශ්‍රය තුළ ලේඛණ ඉදිරිපත් කර ඇති නිසා ජන්ද නාම ලේඛණයට දිය යුතු ලකුණු ලබා දී නොමැති බවත්, මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලබා දෙන නිර්දේශය ක්‍රියාත්මක කිරීමට හැකි වන බවත්ය.

**නිරීක්ෂණ :-**

තවද පරීක්ෂණයේදී පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ජන්ද හිමි නාමලේඛණයේ ඔහුගේ නම ලියාපදිංචිය පිළිබඳ 2017, 2018 සහ 2019 වසර වලදී ගෘහ අංක 9/12, 2/1 යටතේ පෙත්සම්කරුගේ නම ලියාපදිංචි වී ඇති බව මනා පැහැදිලි වේ.

තවද වගඋත්තරකාර පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් පෙත්සම්කරුගේ ඡන්ද හිමි නාම ලේඛණයේ ලියාපදිංචිය පිළිබඳව කිසිදු අවධානයක් යොමු කිරීමකින් තොරව ලකුණු ලබා දීම තුළ පෙත්සම්කරුට හිමිවිය යුතු ලකුණු 7.5 අහිමි වී ඇත. එකී වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියා කලාපය නිසා ගෘහ මූලික ගණය යටතේ ලබා ගත යුතු අවම ලකුණු වන 56.6ට ලගා වීමට තිබූ අවස්ථාව පෙත්සම්කරුට අහිමි වී ඇත. එකී ලකුණු 7.5 ලබා දී තිබුණේ නම් පෙත්සම්කරුට මුළු ලකුණු 61.5ක් උපයාගැනීමට සහ ඔහුගේ දරුවා වගඋත්තරකාර පාසලට ඇතුලත් කිරීමට ද අවස්ථාව තිබූ බවද මෙමගින් නිරීක්ෂණය වේ.

එබැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමෙන් අනතුරුව නිගමනය කර සිටින්නේ වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය තුලින් පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවත්, පෙත්සම්කරුගේ දරුවා වගඋත්තරකාර පාසලට ඇතුලත් කිරීම සුදුසු බව කොමිෂන් සභාව තවදුරටත් නිරීක්ෂණය කරනු ලබයි.

**නිගමනය :-**

මෙම සමස්ථ කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) වගන්තිය සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පෙත්සම්කරුගේ දරුවා වන හෙට්ටිආරච්චිගේ සසේන් සස්විදු දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ ඇතුලත් විය යුතු ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලයට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 04. 11 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන්ට වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ඩ/-

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Human Rights Commission of Sri Lanka